වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2022

ANNUAL PERFORMANCE REPORT 2022



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
DEPARTMENT OF CENSUS AND STATISTICS
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංක 252

පී .එම් .පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්

2022ஆம் ஆண்டுக்கான வருடாந்த செயலாற்றுகை அறிக்கை
தொகைமதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்
செலவின தலைப்பு இல.252

பீ.எம்.பீ.அனுர குமார
பணிப்பாளர் நாயகம்

Annual Performance Report for 2022
Department of Census and Statistics
Expenditure Head No. 252

P.M.P. Anura Kumara
Director General

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යාති පිළියෙල කරනු ලබන ප්‍රධාන ආයතනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. විවිධ සංගණන හා සමීක්ෂණ මඟින් එක් රැස් කොට පිළියෙල කරනු ලබන දත්ත සහ දර්ශකාංක, ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට රටේ ආර්ථික සහ සමාජීය වශයෙන් කාලීනව සිදුවන වෙනස්කම් අධ්‍යනය කිරීමට මෙන්ම රටවල් අතර ආර්ථික සහ සමාජීය තොරතුරු සංසන්දනය කිරීමටද, පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මාධ්‍ය ආයතන හා විවිධ පුද්ගලයින් විසින් විවිධ අවශ්‍යතා සඳහා මෙම තොරතුරු භාවිතා කරනු ලබයි.

නිල සංඛ්‍යාති පිළියෙල කිරීමට අමතරව, සංඛ්‍යාන සේවය අවශ්‍ය වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංඛ්‍යාන උපදෙස් සේවාව ලබා දීමද දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

කෝවිඩ්- 19 වසංගත තත්ත්වයෙන් අනතුරුව රට තුළ උග්‍ර වූ දැඩි ආර්ථික අර්බුද හමුවේ ප්‍රවාහන අපහසුතා සහිත වුවද නිරන්තරයෙන් රාජකාරී සඳහා කැපවෙමින් සංඛ්‍යාලේඛන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම මඟින් 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුද කරන අතර, දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන කාර්යයන් සඳහා දත්ත ලබා දීම මඟින් සහ නන් අයුරින් සහයෝගය ලබා දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන සහ මහජනතාවට මාගේ ස්තුතිය පුද කරමි.



පී. එම්.පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
“සංඛ්‍යාන මන්දිරය”
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල.
2023 මැයි
දුරකථන අංකය: +94 11 2147001
ෆැක්ස්: +94 11 2147011
විද්‍යුත් ලිපිනය: dgcensus@statistics.gov.lk
වෙබ් අඩවිය: www.statistics.gov.lk

பணிப்பாளர் நாயகத்தின் செய்தி

தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம் இலங்கையில் உத்தியோகபூர்வ புள்ளிவிபரங்களைத் தொகுக்கும் முன்னணி நிறுவனமாகும். பல்வேறு தொகைமதிப்புகள் மற்றும் அளவீடுகளில் இருந்து தொகுக்கப்படும் பெரும்பாலான தரவுகள் மற்றும் குறிகாட்டிகள் முதன்மையாக அரசாங்கக் கொள்கைகளை உருவாக்கவும், எதிர்கால அபிவிருத்தித் திட்டங்களைத் திட்டமிடவும், நாட்டில் காலப்போக்கில் பொருளாதார மற்றும் சமூக மாற்றங்களை ஆய்வு செய்யவும், அத்துடன் உலகெங்கிலும் உள்ள நாடுகளுக்கு இடையிலான பொருளாதார மற்றும் சமூகத் தகவல்களை ஒப்பிடவும் பயன்படுத்தப்படுகின்றன. மேலும் இந்த தகவல்கள் ஆராய்ச்சி நிறுவனங்கள், கல்வி நிறுவனங்கள், ஊடக நிறுவனங்கள் மற்றும் பல்வேறு நபர்களால் பல்வேறு நோக்கங்களுக்காக பயன்படுத்தப்படுகின்றன.

உத்தியோகபூர்வ புள்ளிவிவரங்களைத் தயாரிப்பதற்கு மேலதிகமாக, இத்திணைக்களம் பயிற்சித் திட்டங்களை நடத்துவதுடன், புள்ளிவிபரவியல் சேவைகள் தேவைப்படும் பல்வேறு அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களுக்கு புள்ளிவிவர ஆலோசனை சேவைகளை வழங்குகிறது.

கோவிட் தொற்று நோய் நிலைமைகளுக்குப் பின்னர் நாட்டில் நிலவும் கடுமையான பொருளாதார நெருக்கடியின் காரணமாக உருவான போக்குவரத்துச் சிரமங்களுக்கு மத்தியிலும் புள்ளிவிபரப் பணிகளைத் தொடர்ந்ததன் மூலம் 2022 ஆம் ஆண்டில் திணைக்களத்தின் எதிர்பார்க்கப்படும் இலக்குகளை அடைய அர்ப்பணிப்புடன் கடுமையாக உழைத்த திணைக்கள ஊழியர்களுக்கு எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கிறேன். திணைக்களத்தின் புள்ளிவிபரப் பணிகளுக்குப் பல வழிகளில் தரவுகளையும், அன்பான ஆதரவையும் வழங்கிய அரசு மற்றும் தனியார் துறை மற்றும் ஏனைய நிறுவனங்கள் மற்றும் பொதுமக்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.



பீ.எம்.பீ. அநுர குமார
பணிப்பாளர் நாயகம்
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
'சங்கியான மந்திரய'
இல. 306/71,பொல்துவை வீதி,
பத்தரமுல்லை.
2023 மே
தொலைபேசி இல. +94 11 2147001
தொலைநகல் : +94 11 2147011
மின்னஞ்சல் : dgcensus@statistics.gov.lk
இணையத்தளம் : www.statistics.gov.lk

MESSAGE FROM THE DIRECTOR GENERAL

Department of Census and Statistics is the leading agency for compilation of official statistics in Sri Lanka. Most of the data and indicators compiled from various Censuses and Surveys are used primarily to formulate government policies, to plan future development programs, and to study economic and social changes over time in the country, as well as to compare economic and social information between countries throughout the world and this information is used by research institutes, educational institutes, media organizations and various people for various purposes.

In addition to preparing official statistics, the Department also conducts training programs and provides statistical consultation services to various governmental and non-governmental organizations those who require statistical services.

I would like to express my sincere thanks to the Departmental staff who worked hard responsibly with commitment to reach the expected goals of the Department in the year 2022 by continuing the statistical work despite the difficulties of transportation due to severe economic crisis in the country after the Covid epidemic situation. I would like to express my gratitude to the government and private sector and other institutions and the general public who have provided data and there kind support in many ways for the statistical work of the Department.



P.M.P.Anura Kumara
Director General
Department of Census and Statistics
“Sankyana Mandiraya”
No: 306/71, Polduwa Road,
Battaramulla.
May 2023
Tele.No. +94 11 2147001
Fax : +94 11 2147011
Email address : dgcensus@statistics.gov.lk
Website : www.statistics.gov.lk

අන්තර්ගතය

		පිටුව
පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	05
පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරිදැක්ම	09
පරිච්ඡේදය 03	වසරේ මූල්‍ය කාර්ය සාධනය.	11
පරිච්ඡේදය 04	කාර්යය සාධන දර්ශක	23
පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය	38
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	38
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	46

	பொருளடக்கம்	**பக்கம**
அத்தியாயம் 01	நிறுவனத்தின் விவரம் நிறைவேற்றுபொழிப்பு	56
அத்தியாயம் 02	முன்னேற்றம் மற்றும் எதிர்கால கண்ணோட்டம்	61
அத்தியாயம் 03	வருடத்திற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை	63
அத்தியாயம் 04	செயலாற்றுகைச் சுட்டிகள	75
அத்தியாயம் 05	நிலைபேறான அபிவிருத்தி இலக்குகள் (ளுனுபு) அடைவதற்கான செயலாற்றுகை	95
அத்தியாயம் 06	மனிதவள விபரமஅத்தியாயம	95
அத்தியாயம் 07	இணக்கஅறிக்கை	104

	Contents	**Page**
Chapter 01	Institutional Profile/Executive Summary	116
Chapter 02	Progress and the Future Outlook	120
Chapter 03	Overall Financial Performance for the Year	122
Chapter 04	Performance indicators	134
Chapter 05	Performance of the achieving Sustainable Development Goals (SDG)	150
Chapter 06	Human Resource Profile	150
Chapter 07	Compliance Report	159

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය නිල සංඛ්‍යාති සැපයීම සඳහා වූ වගකීම් දරණ ප්‍රමුඛතම රජයේ ආයතනය වේ. එමෙන්ම, ශිෂ්‍යයන්ගේ සිට ජාත්‍යන්තරය දක්වා දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලුම සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් සපුරාලනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් සංගණන හා සමීක්ෂණ පැවැත්වීම මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක ඇතුළු රටෙහි සමාජයීය හා ආර්ථික තත්ත්වයන් අධීක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීමේ වගකීම ඉටු කරනු ලබයි. ඒ අනුව, කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන ලබා දීම සඳහා, නිවැරදිව, විශ්වාසදායක ලෙස හා කාලෝචිතව දත්ත එක් රැස් කිරීමට, සම්පාදනය කිරීමට හා බෙදාහැරීමට අවශ්‍ය කටයුතු ඉටුකර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් පියවර ගනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

1.3 ප්‍රධාන කාර්යයන්

1. දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

    - ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය වසර දහයකට වරක් පවත්වනු ලබන අතර ඒ අනුව මීලඟ සංගණනය 2021 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කරන ලදී. එසේ වුවද, ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීයව ද පැවති කෝවිඩ්-19 වසංගත තත්ත්වය මෙන්ම රටෙහි පැවති ආර්ථික තත්ත්වය ද සැලසුම් කටයුතු වලට ඇති කර ලද බලපෑම හේතුවෙන් ජන හා නිවාස සංගණනය 2023 හා 2024 වර්ෂවලදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට සංගණනය සඳහා අවශ්‍ය සිතියම් සකස් කිරීමේ කාර්යය අවසන්ව පවතී. මෙවර සංගණනයේ තොරතුරු රැස් කිරීම ටැබ්ලට් පරිගණක ආධාරයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා අවශ්‍ය පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු ද මේ වන විට අවසන් වී ඇත. ලැයිස්තුගත කිරීමේ අදියරෙහි ක්ෂේත්‍ර කටයුතු 2023 වර්ෂයේ දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. සංගණනය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන බැවින් එහි පුහුණු කටයුතු පියවර කිහිපයකින් සිදු කිරීමට නියමිත වේ. ඒ අනුව, ලැයිස්තුගත කිරීමේ අදියරෙහි ප්‍රධාන පුහුණු කිරීමේ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 2022 වර්ෂයේ දෙසැම්බර් මස පවත්වන ලදී. මේ වන විට ටැබ්ලට් පරිගණක සඳහා අවශ්‍ය මෘදුකාංග ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කිරීම හා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ඒවා බෙදා හැරීමේ කටයුතු සැලසුම් කරමින් පවතී.

    - සංගණනය ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් සඳහා තොරතුරු සඳහා පවතින දත්ත අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණෙන් 2020 වර්ෂයේ දී ග්‍රාම නිලධාරී කොට්ඨාස පිළිබඳ

මූලික තොරතුරු රැස් කරන ලද අතර එම තොරතුරු පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් අවසන් වාර්තා නිකුත් කිරීමේ කටයුතු 2022 වර්ෂයේ දී අවසන් කරන ලදී.

- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය පිළිබඳ සංගණනය 2023 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා ඇතුළත් විය යුතු ආයතන ලැයිස්තුගත කිරීමේ කටයුතු 2022 වර්ෂයේ දී සිදු කරන ලදී.

2. රට තුළ සමාජ ආර්ථික දත්ත එක් රැස් කිරීම (සාර්ව ආර්ථික දර්ශක) සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කළ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු,

- ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය, ආර්ථික වර්ධන වේගය ඇතුළු සාර්ව ආර්ථික දර්ශක සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

- රටේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට අදාළ දර්ශක සකස් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.

3. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මඟින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

4. දේශීය හා විදේශීය දත්ත භාවිතා කරන්නන්ගේ දත්ත ඉල්ලීම්වලට අනුව අවශ්‍ය දත්ත සකස්කර ලබාදීමේ කටයුතු

- මෙහිදී දෙපාර්තමේන්තුව මඟින් විවිධ සංගණන හා සමීක්ෂණ මඟින් රැස්කර ඇති සංඛ්‍යානමය තොරතුරු දෙපාර්තමේන්තුවේ දත්ත ලබාදීමේ ප්‍රතිපත්තියට අනුව සකස් කර ලබාදීම සිදුවේ. එහිදී අදාළ තොරතුරුවල රහස්‍යභාවය සුරැකෙන අයුරින් එම කටයුතු සිදුකිරීම

1.4 සංවිධාන සටහන (ඇමුණුම 01)

මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයකින් හා දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන අංශ සමූහයකින් සමන්විත වේ.

ප්‍රධාන කාර්යාලයේ අංශ හා ඒකක

ප්‍රධාන කාර්යාලයේ පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15ක් සහ විශේෂ ඒකක 03ක් මඟින් 2022 වසර තුළ අදාළ කාර්යයන් මෙහෙයවන ලදි. ප්‍රධාන කාර්යාලය අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වන අතර එම අංශය මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය කර සමහර ගැටළු සහිත අවස්ථාවල දී අදාළ විසඳුම් ලබාදෙමින් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

තාක්ෂණික අංශ

1	වන අංශය	ජන සංගණන හා ප්‍රජා විද්‍යා
2	වන අංශය	කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා
3	වන අංශය	කෘෂිකර්ම හා පාරිසරික
4	වන අංශය	ජාතික ගිණුම්
5	වන අංශය	ප්‍රකාශන
6	වන අංශය	පුස්තකාල හා ප්‍රලේඛන
7	වන අංශය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ

8	වන අංශය	ආයතනික හා ගිණුම්
9	වන අංශය	නියැදි සමීක්ෂණ
10	වන අංශය	මුද්‍රණ
11	වන අංශය	ක්ෂේත්‍ර කළමනාකරණ
12	වන අංශය	පුහුණු
15	වන අංශය	පර්යේෂණ හා විශේෂ අධ්‍යයන
16	වන අංශය	මිල හා වේතන
18	වන අංශය	සිතියම් විද්‍යා

විශේෂ ඒකක

දත්ත නිකුත් කිරීමේ ඒකකය
අන්තර්ජාතික සංඛ්‍යාලේඛන ඒකකය
තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය

දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල

ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා කාර්යාලවල, දෙපාර්තමේන්තුවට අයත් සංඛ්‍යාලේඛන අංශ පිහිටුවා ඇති අතර දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ට අනුයුක්තව සංඛ්‍යාලේඛන නිලධාරීන් සේවය කරයි. තවද මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම පිහිටි කාර්යාලයක් ද වේ.

මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටි සංඛ්‍යාලේඛන අංශ අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ හාරයේ පවතින අතර එම නිලධාරියාට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාරවරුන්, සංවර්ධන නිලධාරිවරුන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් කිහිපදෙනෙක් අනුයුක්ත කොට ඇත. එක් එක් දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන හා අනෙකුත් දත්ත රැස්කිරීමේ කටයුතු මෙම කාර්යාල මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ හා ප්‍රධාන කාර්යාලය අතර සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේ ද මෙම දිස්ත්‍රික් කාර්යාල මගිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන නිලධාරි හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේ දත්ත රැස්කිරීම සිදුකරයි.

මීට අමතරව විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ තුළ සංඛ්‍යාලේඛන අංශයක් ස්ථාපිත කර ඇති අතර දිවයින පුරා මෙවැනි ශාඛා කාර්යාල 57 ක් පවත්වාගෙන යයි. මෙම සංඛ්‍යාලේඛන අංශ අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛන නිලධාරි/ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී. සංඛ්‍යාලේඛන අංශය පිහිටි ආයතනයේ රාජකාරි සඳහා අවශ්‍ය සංඛ්‍යාලේඛන රැස්කිරීම, සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම මෙම ශාඛා කාර්යාල මගින් සිදුවේ. ප්‍රධාන කාර්යාලය හා අදාළ ආයතන අතර සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම කාර්යාල මගිනි.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අදාළ නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

අදාළ නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රු. 000

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාලසීමාව
19 වන ජාත්‍යන්තර සංඛ්‍යාලේඛකයන්ගේ සම්මේලනයේ දී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියමු අධ්‍යයනය	ලෝක බැංකුව	252-1-1-23-2507 (13)	37,000	2018 ජනවාරි - 2023 දෙසැම්බර්
පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහස්ථ අධ්‍යයනය	UNICEF	252-1-1-25-2507-17 (13)	19,800	2020 දෙසැම්බර්- 2022 දෙසැම්බර්
වැඩිහිටියන්ගේ දුම්කොළ භාවිතය පිළිබඳ සමීක්ෂණය	ලෝක සෞඛ්‍ය සංවිධානය	252-1-1-26-2507 (13)	33,505	2018 අප්‍රේල් - 2022 දෙසැම්බර්
ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	UNFPA	252-1-1-8-2507-16 (13)	7,000	2022 ජනවාරි - 2022 දෙසැම්බර්
ආසියානු සහ පැසිෆික් ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන	ආසියානු සංවර්ධන බැංකුව	252-1-1-05-2507 (13)	5,000	2021 පෙබරවාරි- 2022 දෙසැම්බර්

වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් කරන ලද විදේශ ආධාර ලබන ව්‍යාපෘති

රු. 000

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම	ව්‍යාපෘති කාල සීමාව

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුව ලැබූ විශේෂ ජයග්‍රහණ රාශියකි. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- තිරසාර සංවර්ධන දර්ශක (SDG) කිහිපයක් අලුතින් ගණනය කිරීමට හැකිවීම හා තවත් දර්ශක කිහිපයක් ගණනය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි කිහිපයක් (Modules) දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සමීක්ෂණවලට එකතුකර ක්ෂේත්‍රයේ අදාළ දත්ත රැස්කිරීම සිදුකිරීම.

- නව තාක්ෂණය භාවිතා කරමින් සංගණනය පැවැත්වීමට සංවිධානය කිරීමේ කටයුතු කෝවිඩ්-19 වසංගත තත්ත්වය හා රටෙහි පවතින ආර්ථික ගැටළු මධ්‍යයේ වුවද සිදු කිරීම සහ ජන හා නිවාස සංගණනය 2023 හා 2024 වර්ෂ වලදී සිදු කිරීමට සැලසුම් කටයුතු සිදු කිරීම. සමීක්ෂණවල තොරතුරු රැස් කිරීම නව තාක්ෂණය භාවිතයෙන් සිදුකිරීම.

- පරිශීලකයින්ගේ පහසුව පිණිස දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.

- පැවති ආර්ථික අර්බුදය හමුවේ වුවද මිල දර්ශක ඇතුළු අනෙකුත් සංඛ්‍යාති නියමිත දිනයන්හි දී ප්‍රකාශයට පත්කිරීම.

- පදනම් වර්ෂය 2021 ලෙස යාවත්කාලීන කරන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකය හා කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2023 වර්ෂයේ ජනවාරි මස සිට නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- විශේෂ දත්ත අවශ්‍යතා අනුව සමීක්ෂණ කිහිපයක් ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට සිදුකිරීම.

- දෙපාර්තමේන්තුව මඟින් දත්ත ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා සමාජ මාධ්‍ය භාවිතය ඇතුළු ක්‍රමවේද හරහා නිල සංඛ්‍යාති පිළිබඳව මෙන්ම භාවිතා කරනු ලබන සංකල්ප හා අර්ථ දැක්වීම් පිළිබඳව ද දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීමට පියවර ගැනීම.

- දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන නිල සංඛ්‍යාති පිළිබඳව දෘෂ්‍යාබාධිත පුද්ගලයින්හට අවබෝධයක් ලබා දීමේ අරමුණෙන් සකස් කරන ලද බ්‍රේල් සහ විශාලනය කරන ලද අකුරු සහිත ප්‍රකාශනයෙහි දෙවන වෙළුම සකස් කිරීම.

- විවිධ පුද්ගලික දත්ත ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් (පරේක්ෂණ හා රටේ සංවර්ධනයට අවශ්‍ය දත්ත ඉල්ලීම් හැර) රු. මිලියන 12.8 ක පමණ ආදායමක් ලබාගැනීමට හැකිවීම සහ මෙම ආදායමෙන් 72%ක් පමණ මුදලක් විදේශ මුදල් ලෙස ලබා ගැනීමට හැකිවීම.

- දෙපාර්තමේන්තුව තුළ වර්ෂ කිහිපයක සිට පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු රාශියක් සම්පූර්ණ කිරීමට අදාළ පියවර ගැනීම.

- කර්මාන්ත, වෙළඳ හා සේවා පිළිබඳව තොරතුරු රැස් කිරීමේ කටයුතු ආයතන වෙත මුද්‍රිත ප්‍රශ්නාවලීන් ලබා දීම වෙනුවට විද්‍යුත් තැපෑල භාවිතා කරමින් සිදු කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

දෙපාර්තමේන්තුවේ අදාළ කටයුතු සිදු කිරීමේ දී මුහුණදීමට සිදු වූ අභියෝග කිහිපයකි.

- කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දිගින් දිගටම නොවිසඳී පවතින ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු හා අනෙකුත් ගැටළු.

- කෝවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ වෙළඳ පොළෙහි ඇති වූ විචලතාවයන් හේතුවෙන් ජන හා නිවාස සංගණනය 2024 සිදුකිරීම සඳහා අවශ්‍ය ටැබ්ලට් පරිගණක ඇතුළු අනෙකුත් මිලදී ගැනීම් සම්බන්ධව මුහුණ දීමට සිදු වූ අභියෝග.

- පවත්නා ආර්ථික අර්බුදය හමුවේ මුහුණ දීමට සිදු වූ ඉන්ධන හිඟය, ප්‍රවාහන අපහසුකම් මධ්‍යයේ වුවද නියමිත කාල රාමුව තුළ ගුණාත්මකභාවයෙන් යුතු නිල සංඛ්‍යාති සකස් කිරීම.

- දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරී හිඟය යටතේ වුවද සියළුම නිල සංඛ්‍යාති සකස් කිරීමේ කටයුතු නියමිත කාල වකවානු තුල සිදු කිරීම.

දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව මුහුණ දීමට සිදුවන අභියෝග ජයගනිමින් පහත සඳහන් ඉදිරි ඉලක්ක කරා ළඟාවීමට අප බලාපොරොත්තු වේ.

- ජන හා නිවාස සංගණනය 2024 හි ලැයිස්තුගත කිරීමේ කටයුතු 2023 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ආරම්භ කිරීම සහ නියමිත කාල රාමුව තුළ සංගණනය සාර්ථකව සිදුකිරීම.

- දෙපාර්තමේන්තුවේ සහ විවිධ ආයතනවල පිහිටි සංඛ්‍යාලේඛන අංශවල පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම.

- පාස්කු ප්‍රහාරය හේතුවෙන් කල් දැමීමට සිදු වූ සමීක්ෂණ සිදු කිරීම.

- ජාතික සංඛ්‍යාලේඛන පද්ධතිය සමාලෝචන කිරීමේ වාර්තාවෙහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කරමින් ජාතික සංඛ්‍යාලේඛන පද්ධතිය ශක්තිමත් කිරීම හා දත්ත වල ගුණාත්මකභාවය ඇගයීම සඳහා වන එක්සත් ජාතීන්ගේ මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එල්

අයවැය 2022		සටහන	තත්‍ය 2022	තත්‍ය 2021	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,033,089,382	1,067,023,332	ඒසීඒ-3
-	නැන්පතු		4,674,083	31,633,411	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		45,209,759	46,677,350	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,082,973,224**	**1,145,334,093**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,082,973,224**	**1,145,334,093**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		10,044	**1,582,882**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,082,963,180**	**1,143,751,211**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
900,083,695	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	878,219,815	795,339,534	
177,089,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	147,317,813	141,306,291	ඒසීඒ-2(ii)
13,100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	10,264,161	9,854,448	
-	පොළී ගෙවීම්	8	-	-	
27,305	වෙනත් පුනරාවර්තන වියදම්	9	27,305	-	
1,090,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,035,829,094**	**946,500,273**	
	මූලධන වියදම්				
23,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	15,120,845	9,538,521	
2,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	213,394	4,369,688	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	312,776	3,622,208	
519,700,000	වෙනත් මූලධන වියදම්	15	53,105,941	177,577,867	
545,700,000	**මුළු මූලධන වියදම් (උ)**		**68,752,956**	**195,108,284**	
	නැන්පතු ගෙවීම්		10,550,028	24,200,234	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		47,765,344	57,093,814	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**58,315,372**	**81,294,048**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,162,897,422**	**1,222,902,605**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(79,934,242)**	**(79,151,394)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(79,934,242)	(79,151,394)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	ඒසීඒ-3
			(79,934,242)	**(79,151,394)**	

3.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කන්‍ය	
		2022	**2021**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,084,789,627	3,051,162,591
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	110,555,333	107,999,748
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		**3,195,344,960**	**3,159,162,339**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		100,599,557	92,168,026
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,084,789,627	3,051,162,591
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	9,955,776	15,831,722
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		**3,195,344,960**	**3,159,162,339**

පිටු අංක...08.....සිට .. 34 ..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ඇමුණුම් පත්‍රවල්වල් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...35..... සිට .....46..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් වඩාත්ම ද මෙම අවසන් ගිණුම්වලින් අත්තාරිගත්තා කරවා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මා කරුම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් තහඩුදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවස්ථා ගිණුම්වලින් සඳහන් සංඛ්‍යා, ඊව අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් වපාන් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම යෝග්‍ය ස්වරූප එකඟ වන බවටත් අපගින් සහතික කරනු.

මූල්‍ය පාලනය සඳහා එල දායී අභ්‍යන්තර පාලන පද්ධතියක් චාරිකාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය හාරුනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධතියේ එලදායී ලක්ෂ්‍ය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමේ වරින් වර සමාලෝචනය සිදුකරන බවත් අපගින් සහතික කරනු.

ප්‍රධාන ගණකාධිකාරී
නම :
තනතුර :
දිනය : 28/02/2023

ගණකාධිකාරී
නම :
තනතුර :
දිනය :

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂක (මුදල්)/ ගණකාධිකාරිස් (මුදල්)
නම :
දිනය : 2023-02-23

කේ.එම්.එම්. සුරවීර
ණය කාර්යාංශයේ නතු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය දුර්පත්ති අමාත්‍යාංශයේ ස්ථිරකරණ සහ මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

පී.එම්.පී. අනුර කුමාර
අධිකාරී ජනරාල්
ජාතික්ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක: 306/71, පොල්දුව පාර, බත්තරමුල්ල.

2

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එස්ඒ-සී

	තත්‍ය	
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	79,516,441	55,214,269
අග්‍රිම ලැබීම්	1,033,089,382	1,067,023,332
අත්තිකාරම් අයකර ගැනීම්	47,414,869	48,704,185
තැන්පතු ලැබීම්	4,674,083	31,633,411
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,164,694,775**	**1,202,575,197**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුගල සඩිනාඩි හා මෙහෙයුම් වියදම්	995,137,748	906,182,078
සහනාධාර සහ මාරුකිරීම්	10,264,161	9,854,448
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	32,507,819	11,686,088
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	10,044	1,582,882
අත්තිකාරම් ගෙවීම්	47,765,344	57,011,014
තැන්පතු ගෙවීම්	10,550,028	24,200,234
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,096,235,144**	**1,010,516,744**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**68,459,631**	**192,058,453**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිෂ්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	**68,459,631**	**192,058,453**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**68,459,631**	**192,058,453**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(68,459,631)**	**(192,058,453)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.6 ආදයම් එකතු කිරීමේ කාර්ය සාධනය (අප දෙපාර්තමේන්තුවට අදාල නොවේ)

රු.000

ආදයම් ක්ෙතය	ආදායම් ක්ෙතයේ විස්තරය	ආදයම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම්	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,090,300	1,090,300	1,035,829	95.00%
ප්‍රාග්ධන	545,700	545,700	68,753	12.60%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිධාරී හා සංවර්ධන නිලධාරී දීමනා, වැටුප් හා වේතන	1,537.280	28,829.060	28,099.165	97.47%
2	සෞඛ්‍ය අමාත්‍යාංශය	STEP Survey සමීක්ෂණය සඳහා	1,500	1,500	1,500	100.00%
3	තාක්ෂණ අමාත්‍යාංශය	ජාතික සයිබර් ආරක්ෂාව පිළිබඳ පුරවැසියන්ගේ දැනුවත්භාවය පිළිබඳ ජාතික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා	900	900	737.690	81.96%
4	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	ජන හා නිවාස සංගණනය- CPH පුහුණු ක්‍රියාකාරකම් සඳහා	907.350	907.350	907.343	99.99%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	1,184,910	1,184,910	නැත	100%
9152	යන්ත්‍රෝපකරණ	713,103	713,103		
9153	ඉඩම්	1,186,810	1,186,810		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/D/DCS/02/22/17 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 26 දින

ගණන්දීමේ නිලධාරි
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 විසඳම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

වැය විෂයයන් 4 ක් සඳහා සලසා නිබුණු එකතුව රු. 12,200,000 ක ප්‍රතිපාදන වල සියයට 100 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

(ආ) අධි ප්‍රතිපාදන සලසා ගැනීම.

වැය විෂයයන් 26 ක එකතුව රු. 1,611,772,695 ක් වූ ප්‍රතිපාදන මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු. 514,229,950 ක ප්‍රතිපාදන ඉතිරි වී නිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා නිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 95 දක්වා පරාසයක බව නිරීක්ෂණය විය.

(ඇ) මු.රෙ. 66 මඟින් මාරු කිරීම

මුදල් රෙගුලාසි 66/69 විධි විධාන ප්‍රකාරව වැය විෂයයන් 03 ක එකතුව රු.9,469,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් 07 ක් වෙත මාරු කර තිබුණි. එහෙත් එම වැය විෂයයන් 07 හි එකතුව රු. 23,200,605 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි කර තිබුණු අතර එය අදාල වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ත් සියයට 70 ත් අතර පරාසයක විය.

2.2 හිඟනිටි ණය ශේෂ අයකර ගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිය ගිය නිලධාරීන් තුන් දෙනෙකුට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 453,130 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 03 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 92,750 ක් වූ ණය ශේෂයක් පවතින බවද නිරීක්ෂණය විය.

(ආ) 1991 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල සේවය හැර ගොස් ඇති නිලධාරීන් නව දෙනෙකුට අදාළව එකතුව රු. 489,984 ක් වූ ණය ශේෂ හිඟනිට පවතින අතර එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය වී නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	මු.රෙ. 102 සිට 109	2021 වර්ෂයේ ශාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, අයිතම 480 ක ඌනතාවයක් පැවතුණ ද මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	මුදල් රෙගුලාසි 340	උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 891	ඇප තැන්පත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියට දත්ත නිකුත් කිරීම හා මුද්‍රණය කර දත්ත මුදාහැරීම සිදු කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දත්ත වාර්තා 11 ක් විගණිත දිනය වන 2023 අප්‍රේල් 24 දින වන විටත් මුද්‍රණය කර නොතිබූ අතර එහි ප්‍රමාද කාලය නියමිත දිනයට වඩා මාස 01 ත් 1.5 ත් අතර විය.

(ආ) දත්ත වාර්තා 24 ක් 2023 අප්‍රෙල් 24 දින දක්වාත් වෙබ් අඩවියට නිකුත් කර නොතිබුණ අතර දත්ත වාර්තා 12 ක් වෙබ් අඩවියට නිකුත් කර තිබුණේ නියමිත දිනයට වඩා මාස 01 ත් මාස 20 ත් අතර කාල පරාසයක ප්‍රමාදයකින් පසුව බව නිරීක්ෂණය විය.

(ඇ) කෘෂිකාර්මික අංශයට අදාල වාර්තා සම්බන්ධයෙන් දත්ත මුදාහැරීමේ ඉදිරි දින සටහන් හා දත්ත මුදාහැර තිබූ දිනයන් සම්බන්ධයෙන් අදාල තොරතුරු කෘෂිකාර්මික හා පාරිසරික අංශයෙන්, පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශයට ලබා දී නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොතිබීම

කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ අංශ 13 ක් විසින් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත නිමවුම් මට්ටම් ළඟා කර ගෙන නොතිබුණු අතර ඒවායේ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 15 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක පැවැතුණි. තවද 2023 අප්‍රේල් 06 වන දින විගණනය වෙත ලබාදුන් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ මෘදු පිටපතට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ කාර්යයන් 03 ක හා කම්කරු දෙපාර්තමේන්තුවේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ කාර්යයන් 02 ක නිමැවුම් අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සියයට 75% ට වඩා අඩු මට්ටමක පැවතුණ බව නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.1.1 ප්‍රකාරව ප්‍රසම්පාදනයක් නියමිත කාලය තුල අවසන් කරන බවට සහතික වීම පිණිස , සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කළ යුතු වුවත් ජන හා නිවාස සංගණනය - 2021 සඳහා බෑග් මිලට ගැනීමේ කාර්යයන් සැලසුම්ගත පරිදි ඉටු වී නොතිබුණි. 2020 ජූලි, 2021 ජනවාරි හා 2022 අගෝස්තු මාස වලදී මිල ගණන් කැඳවීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අදාල ප්‍රසම්පාදනය නිම වී නොතිබුණි. යථෝක්ත ප්‍රසම්පාදනය, ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2020 නොවැම්බර් 27 දින අවසන් කළ යුතු වුවද, කාලීනව සැලසුම් ගත පරිදි එය සිදු නොවීම

හේතුවෙන් වෙලදපළ මිල වැඩිවීම නිසා දෙපාර්තමේන්තුවට වැඩි පිරිවැයක් යටතේ ඉදිරියේ මිලදී ගැනීමට සිදුවන බව නිරීක්ෂණය කොරේ.

3.3 **වත්කම් කළමනාකරණය**

(අ) ඇල්බට් වන්දුවංකයේ 16/7 පරිශ්‍රයේ පිහිටා ඇති දෙපාර්තමේන්තු මුද්‍රණ අංශයේ Konica Minolta Biz Hub Press C 1085 ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය 2021 ජනවාරි සිට 2023 අප්‍රේල් 03 දක්වා වර්ෂ දෙකකට වැඩිකාලයක් අක්‍රියව පැවතුණි. එහෙත් මෙම කාලය තුළදී අළුත්වැඩියා සඳහා රු. 3,577,181 වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණ අංශයේ දෙමහල් ගොඩනැගිලි 02 ක ඉහල මහල් අලුත්වැඩියා නොකිරීම නිසා එම උඩුමහල් 2 හි වර්ග අඩි 6856 ක පරිශ්‍රය භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2014 ජනවාරි 11 වන දින අනතුරට පත් කැබ රථයක් වාර්තාවේ දිනය වන විටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින අතර පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබූ මෙම වාහනයට බරපතල හානි සිදු වී ඇති බවත් යථා තත්ත්වයට පත්කල නොහැකි බවත් දේශීය නියෝජිත ආයතනය විසින් දන්වා තිබිය දී ත් පූර්ණ රක්ෂණ වන්දිය ලබාගැනීමට කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ගරාජයකින් අළුත්වැඩියාව සිදු කර රක්ෂණ ආයතනයෙන් රු. 1,514,625 ක වන්දියක් ලබා දී තිබුණි. මෙම අළුත්වැඩියාවෙන් පසුව ද වාහනය ධාවනය තත්ත්වයේ නොමැති බැවින් තව දුරටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ බටහිර අංශයේ ¾ ක් පමණ ඉඩ ප්‍රමාණයක් ගොඩනැඟිල්ල ඉදිකළ දිනයේ සිට විගණිත දින දක්වා කිසිදු භාවිතයකට ගෙන නොතිබුණි. හත්වන මහල බටහිර සම්පූර්ණ කොටස සඳහා මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් යටතේ වායු සමනය සිදුවන බැවින් එම නිස් ඉඩ සඳහාද වායු සමනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව තවදුරටත් නිරීක්ෂණය විය.

4. **මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 34 ක් හෙවත් පුරප්පාඩු 596 ක් පැවතුණ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 146 ක් හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු 147 ක් ඒ අතර විය.

(ආ) 2018 ජනවාරි 24 දිනැති හා 02/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 – කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වාර්ෂිකව ආයතනයේ අපේක්ෂිත නිමැවුම හා එහි ප්‍රගතිය මැනිය හැකි කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇත. පසුගිය වසරට අදාලව එම දර්ශකවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	89% - 75%	74% - 50%
1	දළ දේශීය නිෂ්පාදිතය (GDP) ඇතුළු සාර්ව ආර්ථික දර්ශක දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත් කිරීම	100		
2	ශ්‍රම වෙළඳපල දර්ශක (රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය) විශේෂ දත්ත ප්‍රකාශයට පත්කිරීමේ සම්මතයන්ට අනුව ප්‍රකාශයට පත් කිරීම	100		
3	ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව අදාළ කටයුතු සිදුකිරීම	98		

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශය මගින් පසුගිය වසර තුල සිදු කරන ලද කාර්යයන් මත පදනම්ව ගණනය කරන ලද කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පහත දක්වා ඇත.

01 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	**ජන හා නිවාස සංගණනය (CPH) 2021 (දැන් 2023) සැලසුම් කටයුතු.**			
I	ලැයිස්තුගත කිරීමේ අදියර			
a	CAPI පුහුණු අත්පොත - Samsung tabs (1000) සකස් කිරීම හා මුද්‍රණය අවසන් කිරීම.	100		
b	CAPI පුහුණු අත්පොත - Lenovo tabs (15,000) සකස් කිරීම හා මුද්‍රණය අවසන් කිරීම.	100		
c	F1 - පරීක්ෂාව (Samsung tabs)	100		
d	F1 - පරීක්ෂාව (Lenovo tabs)	100		
e	පුහුණු අත්පොත, පුහුණු කිරීමේ සටහන් සහ වෙනත් ලිපි ලේඛණ මුද්‍රණය කිරීම.	100		
f	පුහුණු කිරීමේ සටහන්, පුහුණු අත්පොත, වෙනත් පෝරම, ලියකියවිලි හා උපකරණ දිස්ත්‍රික්ක වෙත බෙදා හැරීම.			52
g	පුහුණු කිරීම පැවැත්වීම. ලැයිස්තුගත කිරීමේ අදියර (දැනුවත් කිරීම හා ප්‍රධාන කායර්ීලීය නිළධාරීන් පුහුණුව)	100		

II	**ඊ-සංගණනය**			
a	ඊ-සංගණනය සඳහා සූදානම් කිරීමේ කාර්යයන් සිදුකිරීම.	100		
III	**ප්‍රගති අධීක්ෂණය හා තත්ත්ව පාලනය - ලැයිස්තුගත කිරීමේ අදියර**			
a	ආධාරක දත්ත සමුදායන් වැඩි දියුණු කිරීම - ලැයිස්තුගත කිරීමේ අදියර	100		
b	ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා තත්ත්ව පාලන කටයුතු සඳහා අදාළ වැඩි දියුණු කිරීම් සිදුකිරීම - ලැයිස්තුගත කිරීමේ අදියර	100		
IV	**ප්‍රගති අධීක්ෂණය හා තත්ව පාලනය - තොරතුරු රැස්කිරීමේ අදියර**			
a	ආධාරක දත්ත සමුදාය වැඩි දියුණු කිරීම - තොරතුරු රැස්කිරීමේ අදියර	100		
b	ප්‍රගති අධීක්ෂණය කිරීමේ හා තත්ව පාලන කටයුතු සඳහා අදාළ වැඩි දියුණු කිරීම් සිදුකිරීම - තොරතුරු රැස්කිරීමේ අදියර	100		
V	**ප්‍රචාරණය - ලැයිස්තුගත කිරීමේ අදියර**			
a	මුද්‍රිත හා ඩිජිටල් මාධ්‍ය හරහා සංගණන ප්‍රචාරණය - ස්ටිකර්, පෝස්ටර්, ප්‍රවෘත්ති පත්‍ර ලිපි, වීඩියෝ, රූපවාහිනී හා රේඩියෝ දැන්වීම්, සමාජ ජාලා ආදිය.			63
VI	**ප්‍රසම්පාදනය**			
a	ICT උපාංග මිලදී ගැනීම.	100		
b	සංගණනයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා අනෙකුත් මුද්‍රිත අමුද්‍රව්‍ය මිලදී ගැනීම.	100		
VII	**ගනන් ගැනීමේ අදියරය**			
a	F3 ලේඛනවල දත්ත පරිසනකගත කිරීමේ වැඩසටහන සඳහා පරීක්ෂා කිරීම.	100		
b	උපදෙස් අත්පොත, ආකෘති පත්‍ර, අනෙකුත් ලේඛන සකස් කිරීම, පරීක්ෂා කිරීම, සෝදුපත් කියවීම හා මුද්‍රණය	100		
2	දත්ත භාවිතා කරන්නන් සඳහා දත්ත ලබා දීම. (2012 ජන හා නිවාස සංගණන දත්ත මඟින්)	100		
3	ග්‍රාම නිළධාරී කොට්ඨාශ පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් මට්ටමේ වාර්තා වෙබ් අඩවියේ පල කිරීම.	100		

02 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2019	100		
2	වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2020		75	
3	වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2021	100		
4	වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය -2019		85	
5	වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2020		80	
6	වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය-2021	100		
7	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2019	100		
8	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2020	90		
9	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2021	100		
10	මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය	100		
11	මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය - පදනම් වර්ෂය වෙනස් කිරීම	90		
12	ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය	100		
13	ව්‍යාපාර නාමාවලිය (SBR)	100		
14	කොවිඩ් 19 සම්බන්ධව ව්‍යාපාර ස්පන්ධන සමීක්ෂණය	100		

03 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (මහ කන්නය- 2021/22)	100		
2	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (යල කන්නය- 2022)	100		
3	කෘෂිකාර්මික සංගණනය- 2023/24	100		
4	ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම මහ කන්නය - 2021/22	100		
5	ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම යල කන්නය - 2022	100		
6	අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2022	100		

7	ලොකු ඵැණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2022	100		
8	තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2021/22	100		
9	තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2022/2023	100		
10	පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම - 2022	100		
11	ආහාර ශේෂ පත්‍රය - 2021	100		

04 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	ජාතික ගිණුම් වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම,දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට නිකුත් කිරීම සහ මුද්‍රණය කිරීම - 2020,2021.	90		
2	ජාතික ගිණුම් වැඩි දියුණු කිරීම සඳහා පවරා ඇති ක්‍රියාකාරකම් සිදුකිරීම,මාධ්‍ය සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම	90		
3	2021 හතරවන කාර්තුව සහ වාර්ෂික ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
4	2022 පළමු කාර්තු සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
5	2022 දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
6	2022 තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
7	UN Year Book සඳහා දත්ත සැපයීම-2021	100		
